දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපෑල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No: PSC/DIS/01/08/2020-03-09
ඔබේ අංකය / உமது இல. / Your No:
දිනය / திகதி / Date: 2023.~~04.~~ 05.03

සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළු පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

**අල්ලස් වැරදි සම්බන්ධයෙන් රජයේ නිලධරයන්ට එරෙහිව පැවැත්වෙන මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණවලදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් සාක්ෂි ලබා දීම සඳහා කැඳවීම.**

අල්ලස් ලබා ගැනීම් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින රජයේ නිලධරයන් සම්බන්ධයෙන් පවත්වන මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ වලදී, අත්‍යාවශ්‍ය ලිඛිත සහ වාචික සාක්ෂි ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් එවන් රජයේ නිලධරයන්ට එරෙහිව විනය පියවර ගැනීමේදී මතුව ඇති ප්‍රායෝගික ගැටළු පිළිබඳව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි අවධානයට යොමු කර ඇත.

02. ඒ අනුව, අල්ලස් චෝදනා මත <u>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් රජයේ නිලධරයන්ට එරෙහිව නඩු පවරා ඇති අවස්ථාවල දී</u>, එම රජයේ නිලධරයන් සම්බන්ධයෙන් පැවැත්වෙන මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ සඳහා සහභාගී වී සාක්ෂි ලබා දීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්ට අවසර දීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව, එම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BC/SEC/07/2022-II හා 2022.10.07 හා 2023.02.14 දිනැති ලිපි මගින් මා වෙත දන්වා ඇත.

03. තවද, අල්ලස් චෝදනා මත යම් රජයේ නිලධරයකුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නඩු පවරා ඇති අවස්ථාවක, ඉහත දක්වා ඇති පරිදි එම රජයේ නිලධරයා සම්බන්ධයෙන් පවත්නා මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් සාක්ෂි ලබා දීමට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් කරන ඉල්ලීම්, අදාළ ආයතනය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් විසින් වැඩිදුරටත් දැනුම් දී ඇත.

04. ඒ අනුව, අල්ලස් චෝදනා මත අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් රජයේ නිලධරයන්ට එරෙහිව නඩු පවරා ඇති අවස්ථාවල දී, පහත පරිදි ක්‍රියා කිරීමට තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය බලධාරිත්වය යටතට ගැනෙන රජයේ නිලධරයන් සම්බන්ධයෙන් පවත්නා මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්ගේ සාක්ෂි ලබා ගැනීමට කරන ඉල්ලීම්, අදාළ ආයතනය විසින් පරිපාලන බලධරයා හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු බව

ආ) රජයේ නිලධාරීන්ගේ විනය පාලන බලතල ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යම් කමිටුවකට හෝ අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානී හෝ රාජ්‍ය නිලධරයන්ට හෝ විනය බලතල පවරා ඇති අවස්ථාවල ඒ ඒ නිලධාරී කාණ්ඩවල නිලධරයන් සම්බන්ධයෙන් පැවැත්වෙන මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් සාක්ෂි ලබා දීමට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් කරන ඉල්ලීම්, අදාළ ආයතනය විසින් පරිපාලන බලධරයා, විනය බලධරයා හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු බව

05. ඒ අනුව, ඉහත දක්වා ඇති පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

තනුජා මුරුගේෂන්
වැඩබලන ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත:

අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ඔබගේ අංක BC/SEC/07/2022-II හා 2022.10.07 හා 2023.02.14 දිනැති ලිපි අනුව, කරු. දැ.ගැ.ස.